මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சு
**Ministry of Public Security and Parliamentary Affairs**
18 වන මහල, "සුහුරුපාය", බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
18 வதுமாடி, சுகுறுபாய, பத்தரமுல்ல இலங்கை.
18th Floor, 'Suhurupaya', Battaramulla, Sri Lanka

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.

දුරකථන / தொலைபேசி / Telephone: 011 2886067, 011 2887268, 011 2887307
ෆැක්ස් / பெ. / Fax: 011 2887756, 011 2887238
ලේකම් / செயலாளர் / Secretary: දුර./ தொ./ Tel : 011 2887182, ෆැක්ස්/ பெ./ Fax : 011 2887216

දිනය / திகதி / Date: 2025-07-05

සියලුම මාධ්‍ය ආයතන/ මාධ්‍ය ප්‍රධානීන් වෙත,

**2025 ජුලි මස 04 වන දින රාත්‍රී ශ්‍රී ලංකා පොලීසිය හා යුධ හමුදාව එක්ව සිදු කළ විශේෂ මෙහෙයුම පිළිබඳ මාධ්‍ය නිවේදනය**

2025 ජුලි මස 04 වන දින රාත්‍රී ශ්‍රී ලංකා පොලීසිය, ශ්‍රී ලංකා පොලීස් විශේෂ කාර්ය බලකාය, ශ්‍රී ලංකා යුද හමුදාව හා ශ්‍රී ලංකා නාවික හමුදාව එක්ව කඳාන, ජාඇල, වත්තල හා රාගම ප්‍රදේශ කේන්ද්‍ර කර ගනිමින් විශේෂ සෝදිසි මෙහෙයුමක් සිදු කරන ලදී. එහිදී නීති විරෝධී මත්ද්‍රව්‍ය සහ විවිධ නීතිවිරෝධී ක්‍රියාවන් හා සම්බන්ධ පුද්ගලයන් **300කට** අධික පිරිසක් අත්අඩංගුවට ගැනීමට සමත්ව ඇත. 2025 ජුලි මස 04 වන දින රාත්‍රිය පුරා මෙම හදිසි විශේෂ සෝදිසි මෙහෙයුම ක්‍රියාත්මක වූ අතර ජා ඇල, වත්තල, කඳාන හා රාගම ප්‍රදේශ මූලික කර ගෙන රථවාහන සෝදිසි කිරීමේ විශේෂ මෙහෙයුමක්ද ක්‍රියාත්මක කරන ලදී.

විශේෂයෙන්ම මත්ද්‍රව්‍ය හා පාතාලය මෙරටින් තුරන් කර දැමීමේ ක්‍රියාවලියෙහි එක් පියවරක් වශයෙන් මෙම සෝදිසි කිරීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කරන ලදී. ඉදිරියේදී ද මෙවැනි විශේෂ සෝදිසි කිරීම් දිවයින පුරා සිදු කිරීමට බලාපොරොත්තු වන අතර එම සෝදිසි කිරීම් සඳහා මහජනතාව වශයෙන් අවශ්‍ය සහයෝගය ලබා දෙන මෙන් මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යංශය වශයෙන් මහජනතාවගෙන් ඉල්ලා සිටී.

මාධ්‍ය අංශය

මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යංශය